

ශ්‍රීලංකාවට ඉන්දියාවෙන් ළඟ දි ගෙන ආ බිත්තර තොගයක්

# පිටරටින් පොල්!

1 වෙනි පිටුවෙන් ........

## විශේෂ පියවර

මේ තත්වයන්ට පිළියම් වශයෙන් විශේෂ පියවරවල් කීපයක් ගැන්මට රජයට සිදුවීය. ජනාධිපතිවරයාගේ නියමයෙන් මේ සඳහා විශේෂ කමිටුවක් සාදන ලද්දේ ය. වහා යුහුසුළු වන්නට මැති ඇමතිවරුන් සියළු දෙනාගේ ඇස් ඇරුණේ ඉන් අනතුරුව ය. ඔවුන් කලින්ම අර්බුදය හටගත් විගස ක්‍රියාත්මකව සුදුසු පියවරවල් ගත්තේ නම් මේ කාරණා මෙතරම් බරපතළ තත්වයට එන්නේ නැත. එහෙත් ඔව්හු සිය නුවණින් සිතා බලා කිසිදු පියවරක් රටේ කිසිදු කාරණයක් සඳහා නොගනිති. අර්බුදයක් පැන නැගුණ විට සියල්ල ජනාධිපතිවරයා කියන තෙක්ම බලා සිටීම ඔවුන්ගේ කාගේත් විකාර පුරුද්දය. මේ පුද්ගලයින්ට ගෙවන විශාල පඩි සහ අතිරේක දීමනා ගැන බලන විට ඒ ලබන මුදලනට සරිලන සේවයක් අශූ මාත්‍රයකින් වත් ඔවුන්ගෙන් රටට සිදුවන්නේ නැති බව පැහැදිලි ය.

## පාරිභෝගිකයා - බඩුමිළ සහ වෙළඳ මාෆියාව

වෙළඳ ඇමතිවරයා සහ පොල් සංවර්ධන කටයුතු භාර ඇමතිවරයාද එකතුව පොල් වල, බිත්තර වල සහ කුකුල් මස්වල මිළ බැස්සවීම පිණිස වහා පියවර ගත්තේය. එම පියවරවල් නම්:

1. අප රටේ පාරිභෝගික අවශ්‍යතාව සපුරණ තරම් පොල් ඉන්දියාවේ කේරළ යෙන් ලංකාවට ගෙන්වීම.
2. එම පොල් රට පුරා ඇති සතොස ශාඛා මගින් බෙදා හැරීම.
3. ගෙඩිය රුපියල් 30 ගණනේ පොල් පාරිභෝගිකයාට පොල් හිඟ කොළඹ නගර යේ සහ ඒ අවට පෙදෙස්වලට ලොරි මගින් ප්‍රවාහනය කර ලබාගන්නට සැලැස්වීම.
4. එසේම ඉන්දියාවෙන් බිත්තර හා කුකුල් මස් ආනයනය කිරීම

## වෙළඳ මාෆියාවේ කැත ක්‍රියා පටිපාටිය

රජය පොල් සහ බිත්තර හිඟයට පිළියම් යොදමින් ඉන්දියාවෙන් ඒ දෙවර්ගයම ගේනවා යයි කී සැනින් රුපියල් 70 ට ගිය පොල්ගෙඩිය රුපියල් 40ට බැස්සේය. කුකුල් මස් සහ බිත්තර මිළද පහත බැස්සේය. මේ ඉන්දියාවෙන් ඒ බඩු ගෙන්වන්නටත් පෙර ය. ඒ අනුව ඉතා පැහැදිලි ලෙස පෙනෙන දෙය නම් ශ්‍රීලංකාවේ වෙළෙන්දන්ගේ මාෆියාව අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය වල මිළ නග්ගා තැබීම පිණිස බඩු හිඟයක් නිර්මාණය කරන බවයි. පාරිභෝගිකයා නිතර මිළදී ගන්නා දේවල් වෙළෙන්දෝ හිටි හැටියේම ඒ වා සඟවා තබති. ඒ හිඟය ඇතිවූ සැනින්, හැංගූ බඩු ටික ටික එළියට ගනිමින්, කලින් තිබූ මිළට වඩා දෙගුණයකට යළිත් ඒවා අලෙවිකරන්නට පටන්ගනිති. පොල්, බිත්තර සහ කුකුළු මස් ගෙන්වන බවට වෙළඳ මාෆියාවට කළ තර්ජණයට හේතුව ඔවුන් ඉහළ දමා ඇති මිළගණන් පහත දැම්මීම ටය. ශ්‍රීලංකා වේ කුකුළන් ඇතිකිරීම සහ බිත්තර නිෂ්පාදනය කීප දෙනෙකුගේ ඒකාධිකාරයක් වී ඇති අතර ඒ නිසා සුළු වෙන් කුකුළන් ඇතිකිරීම කළ පිරිස් මෑත කාලයේ නැත්තටම නැතිවී ගිය බව පෙනේ.

මේ සියල්ල අප කාටත් හොඳ පාඩමකි. වෙළඳ මාෆියාව අප රටේ පාරිභෝගික සමාජයට කරන විනාශකාරී බලපෑම කෙතෙක්දැයි මින් පෙන්නුම් කෙරේ. සංවර්ධනය වූ බටහිර රටවල මෙන් අප රට ශ්‍රී ලංකාවේ නිෂ්පාදකයාද, වෙළෙන්දාද, පාරිභෝගිකයාද යන තුන් පිරිස අතර සාධාරණත්වය පදනම්කරගත් හුවමාරුවක් සිදු නොවේ. එනිසා පාරිභෝගිකයාගේ යහපත සඳහා කටයුතු කරන සතොස, සමූපාකාරය වැනි රාජ්‍ය අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක වන සංස්ථාවන්ගේ මැදිහත්වීම අවශ්‍ය ය. එමගින් වෙළඳ මාෆියාවේ අහිතකර ක්‍රියාකාරීත්වය අවමකර සාමාන්‍ය ජනයාට සාධාරණයක් ඉටුකර ගත හැකි වෙළඳාම් ක්‍රමයක් ස්ථාපනය කරගත හැකි වෙනවා ඇත.



## බැන්කි මූන් ගේ කමිටුව

රජය විසින් පිහිටුවා ඇති " උගත් පාඩම් සහ ප්‍රතිසංවිධාන කොමිසම " ( Lessons Learnt & Reconcilliation Commission) ඉදිරියේ සාක්කි දීම පිණිස එක්සත් ජාතීන්ගේ ලේකම් බැන්කි මූන් ඇතුළු පිරිසකට ශ්‍රීලංකා රජය එන්නට දීම ගැන පක්ෂව හා විපක්ෂව මත ප්‍රකාශ වන්නට වී ඇත. ලංකා රජය කලින් ඒ අයට එන්නට නොදී වීසා ප්‍රතික්ෂෙපකරන ලදී. දැන් ඔවුනට එන්නට දීම ලංකාව තවත් අනතුරකට හෙළීමක් ලෙස දකින ඇතැම් අය බැන්කි ලා එනවාට තදින්ම විරුද්ධය. මෙය දැන් දේශපාලන මත වාදයකට පෙරළී තිබේ. එම විරුද්ධවීම නොසලකා හැරිය හැකිද නොවේ. මක්නිසාද දැන් ඉතා ටික දිනකට පෙර බැන්කිගේ ප්‍රධා නත්වයෙන් විදේශ දෙමළ ඩයස්පෝරාව ඇතුළු කොටි හිතවාදී යුරෝපීය රටවල් කීපයක් හා ඇමරිකාවද එකතුව ශ්‍රීලංකා රජය සහ හමුදා-වට යුධ අපරාධ චෝදනා ගෙනෙමින් ලංකාව ජාත්‍යන්තර යුධඅධිකරණයට ගෙනියන්නට වලි කෑ හැටි අපට මතකයට එන බැවිනි. කොටි ත්‍රස්තයින් මෙල්ල කිරීම ගැන ඒ කිසිදු රටක් ලංකාවට වචනයකින්වත් ප්‍රශංසා කළේ නැත.

බැන්කි මූන් කිසි පණක් කඳක් නැති පුද්ගලයෙක් වන අතර ඔහු තනිකරම බටහිර රටවල ඇබිත්තයෙකි. ඔහු විස්වාස කළ හැකි පුද්ගලයෙකු නොවේ. ඔහු හා ඔහුගේ පිරිස මේ සාක්කි දීමට එන නියාවෙන් මහන්සිගන්නේ වෙනත් ආකාරයකින් ලංකාව තවත් උගුලකට පටවා ගන්නට බව සිය විරුද්ධත්වය ප්‍රකාශ කරමින් විමල් වීරවංශ සහ චම්පික රණවක යන අමාත්‍යවරු රජයට පහදා දී ඇත.

වැඩිකල් නොව, ගිය මාසයේ ශ්‍රීලංකා ජනාධිපතිවරයා යෙදුණු ඔක්ස්ෆර්ඩ් ගමන මහා විනාශයක් වන්නට ගොස් වුණු බේරිල්ල අපට මතකය. බැන්කිට අතවැනීම එතරම් සුබ දෙයක් ලෙස අපට ද නොපෙනේ.

♦ සංජය

# උගතා යනු කවුරුද?

## විශ්වවිද්‍යාල උපාධිය යනු සුදුසුකමක් මිස උගත්කමක් නොවේ!




උගතා නම් කවරෙක්ද යන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අසීරු කරුණකි. එහෙත් එය මා සිතෙහි බොහෝ කලක සිට පැන නැග තිබූ ගැටළුවකි. මා උපාධිලාභියෙකු නිසාත්, විශ්වවිද්‍යාලයක අවුරුදු තිහක පමණ කාලයක් සේවයේ නිරත වූ නිසාත් බොහෝ දෙනෙකු විසින් මා උගතෙකු ලෙස පිළිගනු ලැබ ඇත. එහෙත් මෙය මට කිසි-සේත් එකඟ විය හැකි කරුණක් නොවේ.

උදාහරණයක් වශයෙන්, විශ්වවිද්‍යා ලයක විෂයයන් සීයක් උගන්වන්නේ යයි සිතමු. එම විෂයයන් සියෙන් එකක් හෝ දෙකක් අප උගතහොත් අපේ උගත්කම සියට එකක් හෝ දෙකක් පමණක් වෙනවා ඇත. එසේ නම් එය උගත්කමක් ද?

දැන් පවතින වාතාවරණයට අනුව විශ්වවිද්‍යාලවලින් පිටවන්නේ සුදුසුකම් ලබාගත් පිරිසක් මිස උගත් පිරිසක් නොවේ. නිදසුනක් වශයෙන් අපි දන්ත වෛද්‍ය සේවය ගනිමු. මුළු දවස පුරා රෝගීන්ගේ කටවල් දිහා බලා ප්‍රතිකාර කිරීම උගත්කමක්ද? විශ්වවිද්‍යාලයෙන් වෛද්‍ය උපාධියක් ලබා, ඉන්පසු උදේ සිට සවස් වනතුරු මුදල් ඉපයීම පමණක් පරමාර්ථය කරගත් පිරිසක් අද බිහි වී සිටිති. මේ අය විශ්වවිද්‍යාල උපාධියත් උගත්කමත් වරදවා තේරුම්ගත් පිරිසකි.

ඉහත සඳහන් මාතෘකාවට මා සපයන විග්‍රහයන් ප්‍රමාණවත් දැයි නොදනිමි. උගතා තමාගේ පුද්ගලභාවය රැකගන්නෙකි. වැඩි පිරිසකගේ මතයට හිස නමා ඔහු ඔවුන් සමග එකතුවන්නෙකු නොවේ. ඔහු තමාට වඩා පළපුරුදු අයටත්, නුවණ මුහුකුරා ගිය අයටත් ගරු කරන්නෙකි. මෙහිදි මා කුඩා කල අසා ඇති උමංදාවේ (උම්මග්ග ජාතකයේ) කතාවක් සිහියට නැගේ. එනම්, මහෞෂධ පණ්ඩිතයෝ වෛදේහ රජුට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කළ ප්‍රඥාවන්ත පඬිරුවනක් වූහ. දිනක් එතුමාගේ පියා රාජසභාවේ රජු සමග අසුන්ගෙන සිටින කල මහෞෂධ පඬිවරයා එතැනට ආවේය. පියාණෝ වහා නැගිට පඬිවරයාට අසුන දුන්හ. රැස්ව සිටි පිරිස පියාණන්ගේ ඒ ක්‍රියාව ගැන පුදුමව විමසද්දී පියාණෝ මෙසේ කීහ.


" මගේ පුතා මට වඩා ප්‍රඥාවෙන් ඉහළය. ඔහු ඒ නිසා මට වඩා වැඩිමහල් කෙනෙකු ලෙස මම පිළිගනිමි....... එබැවින් මා ඔහුට ගරුකළ යුතුය....... හුනස්නෙන් නැගී ඔහුට අසුන දුන්නේ ඒ නිසාය....... "

මෙයින් අපට පෙනී යන්නේ බුද්ධිමත් බව වයසට සම්බන්ධ නැති බවයි.

වරක් ලෝක ප්‍රකට භෞතික විද්‍යාඥයෙකු වන ඇල්බර්ට් අයින්ස්ටයින් ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර තේපැන් සලක වාඩිවී තේ පානය කරමින් සිටියේ ය. මේ වන විට ඔහු වයස්ගතව පමණක් නොව භෞතික විද්‍යාව පිළිබඳ නොබෙල් ත්‍යාගයද දිනා සිටියේ ය. එදින සොළොස් වියේ පමණ ගැහැණු ළමයෙක් විද්‍යාඥයා සමග කතාවට වැටුණාය. " ඔබේ රැකියාව කුමක්ද ? " ඇය අයින්ස්ටයින්ගෙන් ඇසුවා ය. එවිට ඉතා තැන්පත්ව මෙම කුශාග්‍ර බුද්ධිමතා පැවසුවේ " මම භෞතික විද්‍යාව හදාරණ ශිෂ්‍යයෙක්මි " යන්නය. මෙයින් ගම්‍යවන්නේ නියම උගතා කොතරම් නිහතමානී ද යන්න ය.

දැනුම ක්‍රියාවෙන් තොරව පෙන්විය නොහැකි බව උගතා දනී. ඔහු කතා කරන් නේ තමාගේ උගත්කම අනුන්ට පෙන්වීමට නොවේ. ප්‍රකෝප නොවී, ඉතාම සන්සුන් ලෙස සංවාදයේ යෙදීම ඔහුගේ ප්‍රධාන ලක්ෂණයයි. තමා තදින් විශ්වාසකරන ප්‍රතිපත්ති සඳහා සටන්කිරීමට වුවද ඔහු මැලි නොවේ. ඒ සඳහා ජීවිතය පරිත්‍යාග කිරීමට වුව ද ඔහු සූදානම් ය. තවද ඔහු දන්නවා සමහර අයට ජීවිත පරිත්‍යාග කිරීමට තරම් මූලධර්ම නැති බව. මෙවන් අයට ජීවත්වීමට ඇති හේතුවක් ද නැත.

උගතා ඔහුගේ විවේකය ගතකරන හැටි හොඳින් දනී. කෙනෙකු විවේකය ගතකරන හැටියෙන් ඔහුගේ පෞද්ගලිකත්වය අපට මැනගත හැකි ය. එම නිසා උගතාට අන් අයට වඩා බොහෝ සෙයින් කාලය ඉතිරිව තිබේ. ජීවිතයේ ඇති කම්කටොළු සහ ප්‍රශ්න ඔහු මැනවින් දනී. එම දේවල් ඔහු සලකන්නේ තම ගුරුවරයා හැටියට ය. සොක්‍රටීස් පඬිතුමා පවසා ඇත්තේ " ස්වයං පරීක්ෂණයකට භාජනය නොකළ ජීවිතයකින් පලක් නැත " යන්නයි. ( An unexamined life is not worth living) එසේ නොකළ තැනැත්තා ජීවත් වුවද මළ කෙනෙකු හා සමානය.



මහා විද්‍යාඥ ඇල්බර්ට් අයින්ස්ටයින්

**සැබෑ උගතා සිය උගත්කම ආත්මාර්ථයෙන් තොරව, මුදලට වහල් නොවී සමාජ සේවය සඳහාම කැප කරන්නෙකි. ඔහු ඉතා නිහතමානීය. තමා නොදන්නා දේ දන්නා දේට වඩා වැඩි බව ඔහු දනී. එනිසා නිතරම යම් දෙයක් ඉගෙන ගන්නට ඔහු සූදානම්ය. ඔහු දැනුමට වඩා ලෝකය පිළිබඳ අවබෝධයෙන් යුතුව කටයුතු කරන්නෙකි.**

සැබෑ උගතා සිය උගත්කම ආත්මාර්ථකාමී වීමෙන් තොරව, මුදලට වහල් නොවී සමාජ සේවය සඳහා ම කැපකරන්නෙකි. ඔහු නිහතමානීය. තමා නොදන්නා දේ දන්නා දේට වඩා වැඩි බව ඔහු දනී. එනිසා නිතරම යම් දෙයක් ඉගෙන ගන්නට ඔහු සූදානම්ය. ඔහු දැනුමට වඩා අවබෝධයෙන් කටයුතු කරන්නෙකි.

විශ්වවිද්‍යාල යනු උගතුන් බිහිකරන කර්මාන්ත ශාලාවන් යයි සිතා එම කර්මාන්ත ශාලාවලට අමුද්‍රව්‍ය සපයන පුද්ගලික ආයතන දැන් ශ්‍රීලංකාවේ හතු පිපෙන්නාක් මෙන් බිහිවී තිබේ. එම නිසා අද අප රටේ අධ්‍යාපනය නොසිතූ තරම් වෙළඳ භාණ්ඩයක් මෙන්ම අවුලක් බවට පරිවර්තනය වී ඇත.

විශ්වවිද්‍යාලයක ප්‍රධාන අරමුණ වනුයේ මානසික තුලනය ඇති පුද්ගලයෙකු බිහිකිරීමයි. එසේ මානසික තුල-නය ඇති පුද්ගලයා වෛද්‍යවරයෙකු වුවත්, ඉන්ජිනේරුවෙකු වුවත්, වෙනත් කිසියම් රැකියාවක යෙදුනත්, මා ඉහත සඳහන් කළ පරිදි උගතෙකු මෙන් හැසිරී සමාජයට සේවය කරන පුද්ගලයෙකු වෙයි. අප රටට අවශ්‍ය එවැනි අයයි.

මේ ලිපිය කියවා උගත්කමත්, විශ්ව විද්‍යාලයකින් ලබන සුදුසුකමත් යන දෙක්හි වෙනස දැනගැනීමට පාඨකයාට හැකි වුවහොත් එයම මට ඉමහත් සතුටකි.

♦ මහාචාර්ය සම්පත් ඇන්සන් ප්‍රනාන්දු
Shenfield, Essex UK